# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

(නව / පැරණි නිර්දේශය)

සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON- E 1025

එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

ප්‍රශ්න තෝරා ගත යුතු ආකාරය පිළිබඳ උපදෙස්

නව නිර්දේශය සිසුන් (ප්‍රථම වරට පෙනී සිටින) එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

පැරණි නිර්දේශය සිසුන් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස - එංගලන්තයේ ආර්ථික ඉතිහාසය

01. "මධ්‍යතන යුගයේ අවසාන භාගයේ දී එංගලන්තයේ සිදුවූ ප්‍රබලතම සමාජ, ආර්ථික විපර්යාසය වූයේ බණ්ඩාරගම් ක්‍රමය බිඳ වැටීමයි " මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

02. ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරය යනු කුමක්ද? පළමු ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරයෙහි සමාජ ආර්ථික ප්‍රතිඵල පිළිබඳ විමසුමක් කරන්න.

03. "කාර්මික විප්ලවය මුලින්ම එංගලන්තයේ ඇතිවීමට බලපෑ හේතු වූයේ එරට කලක් තිස්සේ විවිධ අංශවලින් අත්කරගෙන තිබූ දියුණුවේ ප්‍රතිඵලයන් ය." විමසන්න.

04. එංගලන්තයේ ආර්ථික සංවර්ධනයට දුම්රිය ප්‍රවාහනයේ වර්ධනය තුළින් ලැබුණු දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

05. චාර්ටිස්ට් ව්‍යාපාරය හඳුන්වා එයින් දිනාගැනීමට අපේක්ෂා කරන ලද අයිතීන් පිළිබඳ විමසුමක් කරන්න.

## 11 කොටස - ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

06. රාජකාරි ක්‍රමය අවලංගු කිරීමෙහි ලා බලපෑ පසුබිම සාකච්ඡා කොට එය අවලංගු කිරීමෙන් බ්‍රිතාන්‍ය රජය අපේක්ෂා කළ අරමුණු කොතෙක්දුරට සාර්ථක වූයේ දැයි විමසන්න.

07. 1832 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා මගින් දිවයිනේ ආර්ථිකමය සහ පරිපාලනමය වශයෙන් ඇති කරන ලද වෙනස්වීම්වල බලපෑම පිළිබඳ විග්‍රහයක් කරන්න.

08. වැවිලි කර්මාන්තයේ ආරම්භය සහ ව්‍යාප්තිය හේතු කොට ගෙන ඇති වූ සමාජ ආර්ථික විපර්යාසයන් උඩරට ග්‍රාමීය ජන සමාජය කෙරෙහි ඇතිකරන ලද බලපෑම පිළිබඳ ඇගයීමක් කරන්න.

07. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ අනුගමනය කරන ලද ඉඩම් ප්‍රතිපත්තිය විචාරාත්මකව අගය කරන්න.

08. 19 වන සියවසේ දකුණු ඉන්දීය කම්කරුවන්ගේ පැමිණීමෙහි ලා බලපෑ අභ්‍යන්තර සහ බාහිර සාධක කවරේද?

******************************